

පොසොන් පොහෝ දා

මිස්සක පර්වත මුදුණේ
වැඩ සිටි අනුබුදු පෙනුණේ
දෙටු පැතිස් නරනිඳු තුළ
පින් සිත මතුවුණි සැනිනේ
අත දුණු හී බිම වැටුණා
තිසරණ පන්සිල් ගැනුණා
රහත් මිහිඳු හිමි හින්දා
සිරිලක බොදු රටක් වුණා.

නෙත්ම් නිලූකා පතිරණ
බෝමිරිය මධ්‍ය මහා විද්‍යාලය
බෝමිරිය Sri Lanka

මිහින්තලාවේ

දෙටු පැතිස් රජ මැතිඳුන්
පිරිවර සෙන් බල සමගින්
මුව දඩයම පිණිස ගියේ
මිහින්තලාවේ

අදිසි මුවෙකු දුටු නිරිඳුන්
දිවගිය කල ලුහුබඳිමින්
තිස්ස තිස්ස හඬක් නැගිණ
මිහින්තලාවේ

තිස්ස කියන හඬ ඇසුණම
නිරිඳුන් වට පිට බැලුවම
කහපාටට දිලෙන රුවකි
මිහින්තලාවේ

ඉදිරියටම ගිය නිරිඳුන්
ආ ගිය වතගොත අසමින්
අනුබුදු ගුණ සුවඳ දැනුණ
මිහින්තලාවේ

♦ **එන්. තාරිකා රසාංගි**
මහමායා බාලිකා විදුහල
මහර කඩවත Sri Lanka

මගේ සතුට

සමනලයා ලස්සනයි
රෝස මලේ පැණි උරයි
හා පැංචා අහිංසකයි
උඳුපියලිය කා පැනයයි

මගේ නංගි හරි වසයි
එයාට මං ආදරෙයි
පුංචි මල්ලියා මිදුලේ
දුව පනිමින් ගී ගයයි

♦ **ඛුෂානි තාරකා සසිදරන්**
ශාන්ත වින්සන් බා විදුහල
මඩකලපුව Sri Lanka



Lightning විදුලිකෙටීම

Lightning can be as hot as 15,000 C - five times warmer than the Sun. It can travel up to 70 km horizontally before hitting the ground. One flash can be upto 12 km long and carry a 1 billion volt shock. A strike can be lethal to someone standing 18 m away. If lightning hits water, anyone within 180 m is in for the shock of their life.

විදුලිකෙටීමෙහි දී උත්පාදනය වන විදුලිය සෙන්ටිග්‍රේඩ් අංශක 15,000 තරම් විය හැකි අතර, එය සූර්ය රශ්මියට වඩා පස් ගුණයක් උශ්ණත්වයෙන් ඉහළය. ඒ එක් ආලෝක ධාරාවක් කිලෝමීටර් 70 ක දුරක් හරස් අතට විහිදී ගමන්කර, ඉක්බිති පොළවට පතිත වන්නේය. එක් විදුලි එළියක විහිදයෑම කි.මී. 12 ක දුරක් විහිද යන අතර, එය බිලියනයක වෝල්ටීයතාවක කම්පනයක් ඇතිකරවයි. විදුලිකෙටීමකදී මීටර් 18 ක් ඈත සිටින කෙනෙකුට වුවද වැදුණොත් එය මාරාන්තික වියහැකිය. කොටන විදුලිය වතුරකට වැදුණොත් ඒ වතුරේ සිටින කෙනෙක් මීටර් 180 ක් දුරින් සිටියත් වදින අකුණු කම්පනය ඉතා භයානකය.

♦ *Auntie Ramani (රමණී නැන්දා)*

නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

BANK OF CEYLON (UK) Ltd.

ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
දැන් විවෘතයි...!

- ඉතිරිකිරීමේ ගිණුම්
- ජංගම ගිණුම්
- ස්ථාවර තැන්පතු
- ළමා ඉතිරිකිරීමේ ගිණුම්
- ආයතනික ගිණුම්
- ලංකා බැංකු ගිණුම් හිමියන් සඳහා නොමිලේ මුදල් පැවරුම්
- පුද්ගලික හා ආයතනික ණය පහසුකම්
- ආනයන/අපනයන මූල්‍යකරණය
- භාණ්ඩාගාර සේවාවන්
- විදේශ විනිමය සේවාවන්
- සංචාරක කටයුතු සඳහා බැංකු සේවාවන්

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD



මේ නොබෝ දා ශ්‍රීලංකාවේ මුද්‍රණයෙන් බිහිවූ **ගිම්හාන ගීතය** නම් නවකතාව වනාහි ජර්මණියේ සුප්‍රකට ලේඛකයෙකු වන බර්නාඩ් ස්ලින්ක් (Bernhard Schlink) විසින් රචනාකරන ලද **Der Voleser** නම් කෘතියේ සිංහළ පරිවර්තනයයි. පරිවර්තක රන්ජිත් කුරුප්පු ලේඛකයායි.

කතාව ලියැවී ඇත්තේ මූලික වශයෙන් අවුරුදු පහළොවක් වයසැති මයිකල් නමැති පිරිමි ළමයෙකු සහ තාරුණ්‍යයෙන් මැදිවියට එළඹෙන හනා ස්මිට් නමැති කාන්තාවක අතර ඇති සම්බන්ධතාවක් වටාය. ඒ සබඳතාව ප්‍රේමයකට වඩා අනුරාගයට බර වූවකි. එසේම ඒ සබඳතාව ඉදිරියට යන්නේ ද එම ශාරීරික අවශ්‍යතාව නිසා ය. එහෙත් එබඳු බැඳීම් වුව ද කොතෙක් කල් පැවතිය හැකිද? වැඩිහිටි සමාජය හමුවේ එය අසම්මත ක්‍රියාවක් ලෙස ගැණෙ නවා ඇත. විරුද්ධතා මතුවෙනවා ඇත. තවමත් පාසැල් වියේ සිටින පිරිමි ළමයා ඒ වින්දනය කෙනෙකු ගේ ජීවිතයට කලාතුරකින් ලැබෙන අපූර්ව අත්දැකීමක් වශයෙන් සලකා ඇති අයුරු පැහැදිලි වෙයි.

සිදුවූ කතාව අපට කියන්නේ මයිකල්ය. ඔහු සිද්ධීන් පෙළ ගස්වා ඇත්තේ ඔහු සියල්ල දුටු ආකාර යෙනි. කාන්තාව හා තවමත් ළමා වියේ පසුවන තමාත් අතර වූ සම්බන්ධය කියන ගමන් ඔහු සිය පවුලේ තොරතුරුද ජර්මන් සමාජයේ සැබෑ හැඩරුවද අපට විස්තර කරන අතර එම විස්තර මගින් ළමයෙකු කෙමෙන් නුවන මුහුකුරා යමින් වැඩිහිටි තාරුණ්‍ය වෙත දින දින ළඟා වන ආකාරය ද ඉබේම අප තුළ සටහන් වෙයි.

" හනා සහ මා අතර ඇති වූ සම්බන්ධය හේතුකොට ගෙන වචනයෙන් විස්තර කළ නොහැකි තරම් වේදනාවක් මම වින්දෙමි. ඒ නිසාම කිසිවෙකුට ලේසියෙන් මා වෙත සමීපවීමට නොහැකි පෞරුෂ යක් මම ගොඩනගා ගත්තෙමි. කිසිවෙකුට මා හට රිදවන්නට මා සසල කරන්නට අවකාශයක් ඉන් පසු ඇති නොවන්නේය....."

හනා සමග වූ සබඳතාව සාමාන්‍යයෙන් සමාන වයසේ ගැහැණු ළමයෙකු හා ඇතිවුණු දෙයකට වඩා වෙනස් බව මයිකල්ට සැබැවින්ම දැනෙන්ට වූයේ දිනක් හදිසියේම හනා නිවසෙන් ගොස් ඇති බව දැනගත් විටය. එය ඔහුගේ සිතට විශාල බලපෑමක් කර ඇති බව ද දැනුණේ එදා ය. ඔහු ඒ ගැන මෙසේ කියයි.

" වෙනදා මෙන් නාන තටාකය වෙත ගිය මම කාටත් නොපෙනෙන තැනක හිඳ මධ්‍යාහනය ගතකළෙමි. ඇත්තෙන්ම ඇය නැති පාළුව මට දරාගත නොහැකිවිය."

කතාව කෙමෙන් නොසිතූ දෙසකට හැරෙයි. මයිකල්ට යළිත් හනා නම් කාන්තාව මුණගැසෙන්නේ ඔහු නීතිය හදාරණ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු වූ පසුවය. කිසිසේත් නොසිතූ පරිසරයක් වන උසාවියකදීය. දැන් විත්තිකාරියකව සිටින ඇය ඔහු හැඳිනුවේ නැත. හැනා වෙනුවෙන් කිසිවක් කළ යුතුයයි ඔහුට හැඟුනත් එය යුද්ධය හා වධකාගාර සම්බන්ධ නඩුවක් බැවින් ඔහුගේ සිත එඩිතර වූයේ නැත. මුලු උසාවියම ඇයට එරෙහි වෙද්දී ඔහුගේ හෘද සාක්ෂිය පමණක් සැබැවින්ම ගත්තේ ඇයගේ පැත්තය. ඔහුගේ නිහඬතාව පසුව ඔහුටම වධ දුන් කාරණාවක් විය. එය පසුතැවිල්ලකට හැරිණ.

කතාව අවසන්වන්නේ ඉතා අනුවේදනීය ආකාරයෙනි. එය පාඨකයාගේ සිත දැඩිව සසල කරයි. මනුෂ්‍යත්වය තුළ බොහෝවිට නොපෙනී සැඟව තිබෙන අසරණකමද එය ගොළු බසින් පිළිසරණක් යදින බවද මෙනෙහිව කිසියම් ශෝකයක් අප හද දැවටෙයි.

රන්ජිත් කුරුප්පු ලේඛකයා හා දක්ෂ සිනමාකරුවා බොහෝ කලක සිට වෙසෙන්නේ ජර්මණියේ බොන් නගරයේය. ජර්මන් බස පිළිබඳව මනා පරිචයක් ඇති ඔහු බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෙකි. එසේම ගිම්හාන ගීතය කෙළින්ම ජර්මන් නවකතාවෙන්ම කළ පරිවර්තනයකි. ඔහු ප්‍රවීන එමෙන්ම සාර්ථක නවකතා පරිවර්තකයෙකු ලෙස අද ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශකයින් ගේ ද පාඨකයින්ගේ ද නොමඳ ගෞරවයට පාත්‍රව සිටී.

මරණයේ දොරටුව, යුද්ධයේ අතුරු කතාවක්, හිට්ලර්ගේ අවසානය, කාන්තාරයේ කුසුම, කාන්තාරයේ දරුවෝ, සහ ගිනි මැද සක්මන යන කතා ඔහු කළින් කළ පරිවර්තන වෙති.

ඒ අතරින් **කාන්තාරයේ කුසුම** මෑත කාලයේ අප රටේ ඉතා සුළු කාලයක් තුළ වැඩි යෙන්ම අළෙවි වූ පරිවර්තන කෘතිය ලෙස හැඳින්විය හැකිය. **ගිම්හාන ගීතය** ද ඒසා පාඨක ප්‍රතිචාරයක් ලබනු නොඅනුමානය.

♦ **දයා ආනන්ද**



අපේ දරුවන්ට ඉගෙනගන්න යාපනයේ සිංහළ මහා විද්‍යාලය නැවත විවෘත කරන්න!

යාපනයේ සිංහළයෝ රජයෙන් ඉල්ලති

බොහෝ කාලයක් තිස්සේ යාපනයේ සිංහළ මහා විද්‍යාලයක් තිබුණේය. යාපනය හා ඒ අවට උතුරේ ප්‍රදේශවල වාසයකළ සිංහළ ජනතාවගේ දරුවන් අධ්‍යාපනය ලැබුයේ ඒ සිංහළ මහා විද්‍යාලයෙනි. සිංහළ පමණක් නොව දෙමළ ළමයි ද එහි ඉගෙන ගත්හ. 1983 යුද්ධය ආරම්භ වුණු විට ඒ පළාත්වල විසූ සිංහළ ජනතාව කොටි ත්‍රස්තවාදය නිසා ගම් බිම් රැකියා හා ව්‍යාපාර සියල්ල අතහැර ජීවිත බේරාගෙන දකුණ ඇතුළු වෙනත් පළාත්වලට පැන ගියෝය. එකද සිංහළයෙක්වත් එහි ඉතුරු වුණේ නැත. සිංහළ මහා විද්‍යාලය වැසුණි. ඒ ගොඩනැගිල්ලටද යුද්ධයෙන් අලාභහානි විය.

යුද්ධය අවසාන වූ පසු ගිය අවුරුද්දේ අග හරියේ යාපනය අතහැර ගොස් සිටි සිංහළයෝ එකා දෙන්නා ඉතා අකමැත්තෙන් යළි එහි ගියෝය. දැන් මේ වන විට එහි ගොස් සිටින පවුල් සංඛ්‍යාව **178** කි. එහි පුද්ගලයින් **523** කි. ඒ කිසිවෙකු තවමත් හරිහැටි පදිංචි කරවා නැත. මෑතක් වන තුරු ඔවුන් තාවකාලිකව නවාතැන් ගෙන සිටියේ යාපනය දුම්රියපළේ ගොඩනැගිලි වලය. ඒ සිංහළ ජනතාවට දැන් ඇති ලොකුම ගැටළුව තම ළමයින්ට ඉගෙන ගන්නට සිංහළ පාසැලක් ඒ කොහිවත් නොතිබීමයි. ඒ නිසා වසාදමා ඇති සිංහළ මහා විද්‍යාලය පිළිසකරකර විවෘතකර දෙන ලෙස ඔවුහු රජයෙන් ඉල්ලා සිටිති. යාපනයට ගොස් දැන් අවුරුද්දක් පමණ වන නමුත් ඒ පවුල්වල ළමයි මේ තාක් පාසැල් ගොස් නැත. ඔවුන්ට ඉගෙනුම ලබන්නට විදියක් නැත.

හැකි ඉක්මනින් සිංහළ මහා විද්‍යාලය නැවත විවෘතකරන ලෙස බොහෝ සිංහළ සංවිධාන ද රජයෙන් ඉල්ලා සිටිති.